උක්ල් හෝ උරයිනා (ගෝත්රයේ) මිනිසුන් පිරිසක් පැමිණියෝය. මදීනාවේ කාලගුණය ඔවුනට ගැළපුනේ නැත

අනස් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. හෙතෙම මෙසේ පැවසීය: "උක්ල් හෝ උරයිනා (ගෝත්රයේ) මිනිසුන් පිරිසක් පැමිණියෝය. මදීනාවේ කාලගුණය ඔවුනට ගැළපුනේ නැත. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔටු කිරි දොවන්නෙකු කැඳවා උන්ගේ මූත්රා හා උන්ගේ කිරි පානය කරන්නට දෙන මෙන් නියෝග කළහ. පසුව ඔවුහු එහි ගියහ. ඔවුහු නිරෝගීභාවය ලැබූ කල්හි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ එඬේරාව මරා දමා සියලුම ඔටුවන් දක්කාගෙන ගියහ. දහවල් ආරම්භයේ මෙම පුවත පැමිණි විට, ඔවුන් පසුපසින් ලුහුබැද යන්නට පිරිසක් යැවූ අතර මධ්යහ්න වන කල්හි, ඔවුන්ව රැගෙන එන ලදී. පසුව ඔවුන්ගේ අත් හා ඔවුන්ගේ පාද කපා දැමීමට
එතුමාණෝ නියෝග කළහ. ඔවුන්ගේ ඇස්වලට හංවඩු ගසා හිරු අව්වට දමන ලදී. ඔවුන් ජලය
ඉල්ලා සිටිය ද ඔවුනට එය සපයනු ලැබුවේ නැත. අබූ කිලාබා තුමා මෙසේ පැවසීය: මොවුන් සොරකම් කර ඇත. ඝාතනය කර ඇත. මොවුන් දේවත්වය විශ්වාස කළ පසු එය ප්රතික්ෂේප කර ඇත. අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් සමග සටන් කර ඇත." [صحيح] [متفق عليه]

උක්ල් හා උරයිනා ගෝත්ර දෙකින් පිරිසක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණියෝය. ඔවුන්ගේ කුසවල් ඉඳිමෙන්නට ගත් රෝගයක් ඔවුනට වැළඳුණේය. මදීනාවෙහි ආහාර හා කාලගුණය ඔවුනට අනුගත නොවූ බැවින් මදීනාවේ පදිංචි වීමට ඔවුහු පිළිකුල් කළහ. සදකා භාණ්ඩයට අයත් ඔටුවන් වෙත ගොස් උන්ගේ මූත්රා හා උන්ගේ කිරි පානය කරන මෙන් ඔවුනට නියෝග කළහ. පසුව ඔවුහු එහි ගොස් නිරෝගීභාවය ලබා පුෂ්ටිමත් වී ඔවුන්ගේ වර්ණය ඔවුනට නැවත ලැබුණු කල්හි ඔවුන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ එඬේරාව මරා දමා සියලුම ඔටුවන් දක්කාගෙන ගියහ. දහවල් ආරම්භයේ මෙම පුවත පැමිණි විට, ඔවුන් සොයා පිරිසක් යැවූ අතර ඔවුහු ඔවුන්ව අල්ලා ගත්හ. මධ්යහ්න වන කල්හි, ඔවුන්ව සිරකරුවන් ලෙස නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත රැගෙන එන ලදී. පසුව ඔවුන්ගේ අත් හා ඔවුන්ගේ පාද කපා හරින මෙන්ද ඔවුන්ගේ ඇස් අන්ධ කරන මෙන් ද නියෝග කළ අතර හිරු අව්වට දමන ලදී. ඔවුන් එඬේරාව මරා දැමුවේ ද ඒ අයුරිනි. ඔවුන් ජලය ඉල්ලා සිටිය ද ඔවුන් මිය යන තෙක්ම ඔවුනට එය සපයනු ලැබුවේ නැත. අබූ කිලාබා තුමා මෙසේ පවසයි. "මොවුන් සොරකම් කර ඇත. ඝාතනය කර ඇත. මොවුන් දේවත්වය විශ්වාස කළ පසු එය ප්රතික්ෂේප කර ඇත. අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් සමග සටන් කර ඇත."

http://www.sunnah.global/hadeeth/si/show/66205